# රණවිරු ඇපරල් - ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඇඟළුම් කර්මාන්ත ශාලාව

RANAVIRU APPAREL

## 2026 / 2027 වර්ෂය සඳහා භාණ්ඩ සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

01. 2026 / 2027 වර්ෂය තුළ රණවිරු ඇපරල් ඇඟලුම් කර්මාන්තශාලාව වෙත භාණ්ඩ / සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා සැපයුම්කරුවන් වෙතින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

| කාණ්ඩය | භාණ්ඩ |
|---|---|
| A | ඇඟලුම් අමු ද්‍රව්‍ය (බොත්තම්, ස්නැප් බටන්, (සිල්වර් කලර් සහ ප්ලාස්ටික්), ෆියුසින්, ෂර්ට් කුෆ්නර්, ෂිපර්ස්, අයිලට්ස්, සිල්වර් හුක්, පේපර් පින්, රිබන්, මේන් ලේබල්, සයිස් ලේබල්, වෙල්ක්‍රෝ, වෙල්බෝන්, ටැල්ක් ෂීට්, ලැමිනේටඩ් රෙක්සින් ටේප්, බකල් ටේප්, පොලිෂ් බකල්, ඉලාස්ටික්, වටකුරු සහ සමතල ඉලාස්ටික්, ටුවිල් ටේප්, වේස්ට් කෝඩ් හා කෝඩ් ස්ටොපර් කොළර් සහ ස්ලීව් බෑන්ඩ් ආදිය). |
| B | රෙදිපිළි (වියන ලද හා ගොතන ලද). (ට්විල්, ට්‍රයිකෝට්, සිංගල් ජර්සි, වෙට්ලුක්, පෝලෝ ක්නිටඩ් (පීකේ), පොලියෙස්ටර්, කපු රෙදි, පොකට්න් රෙදි, පිජාමා රෙදි, විස්කෝස් , පොප්ලින්, මදුරු දැල් රෙදි, පොලිප්‍රොපර්ලින් රෙදි, පැජරෝ, මර්ෂිලා සහ කැස්පර් ආදිය). |
| C | රෙක්සින් මැටිරියල්ස් / ඩයරි ක්ලෝත්, ස්පොන්ජ් ෂීට්, පුංචෝ කේප් අමු ද්‍රව්‍ය ආදිය. |
| D | නූල්. |
| E | ඇසුරුම් ද්‍රව්‍ය (පොලි බෑග්, ගම් ටේප්, සෙලෝ ටේප්, ලේබල් රෝල්). |
| F | ඉදි කටු, ඉන්ක් රෝල් සහ වයිට් ඔයිල්. |
| G | කර්මාන්තශාලා මහන මැෂින් / අමතර කොටස් මිලදී ගැනීම, මහන මැෂින් අලුත්වැඩියාව / සේවා සහ කුලී පදනම මත මිලදී ගැනීම. |
| H | නිමි ඇඳුම් සඳහා එම්බ්‍රොයිඩර් හා මුද්‍රණ කටයුතු (Sublimation Print / DTF Print / Screen Print etc.) |
| I | කර්මාන්ශාලා සහ කාර්යාල ලිපිද්‍රව්‍ය හා ක්‍ෂය වන ද්‍රව්‍ය (මාකර් පේපර්, ප්ලොටර් පේපර්, බ්‍රිස්ටල් බෝඩ්, බොක්ස් බෝඩ් ආදිය). |
| J | තිර මුද්‍රණ තීන්ත හා ඊට අදාළ භාණ්ඩ / ද්‍රව්‍ය. |
| K | ඇඟළුම් කර්මාන්තය හා සම්බන්ධ ලී බඩු සහ කාර්යාල උපකරණ. |
| L | ඉදිකිරීම් / අලුත්වැඩියාවන් සඳහා හාඩ්වෙයාර් සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සහ යන්ත්‍ර උපකරණ කුලී පදනම මත ලබා ගැනීම. |
| M | ඉදිකිරීම් / අලුත්වැඩියාවන් සඳහා විදුලි අයිතම / භාණ්ඩ සහ විදුලි උපකරණ / අමතර කොටස්. |
| N | ඉදිකිරීම් / අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය දැව. |
| O | මුද්‍රණ කටයුතු (පොත් ආකෘති පත් සහ ස්ටිකර් ආදිය). |
| P | වායුසමීකරණ යන්ත්‍ර සහ උපාංග. |
| Q | පරිගණක, පරිගණක උපාංග, ඡායා පිටපත් යන්ත්‍ර සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර අමතර කොටස් ප්ලොටර් මැෂින් තීන්ත, ටෝනර් ආදිය. |
| R | සියළුම සේවා හා අලුත්වැඩියා කිරීම (වායුසමීකරණ යන්ත්‍ර, බොයිලේරු යන්ත්‍ර, බහිස්‍රාවිය පද්ධතිය, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර). |
| S | පවිත්‍රතා ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය (පිරිසිදු කාරක ද්‍රව්‍ය, සුවඳකාරක ද්‍රව්‍ය, පිරිසිදු කාරක උපකරණ හා විෂබීජනාශක ද්‍රව්‍ය). |
| T | පිහිණුම් තටාක සඳහා අවශ්‍ය සියළුම උපකරණ, රසායනික ද්‍රව්‍ය, බොයිලේරු රසායනික ද්‍රව්‍ය. |

02. අයදුම් කරනු ලබන සැපයුම්කරුවන් 2026 වර්ෂය වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ දුරකථන නාමාවලිය කහ පැහැති (යෙලෝ පේජස්) හෝ දුරකථන නාමාවලිය දේදුනු පැහැති (රේන්බෝ පේජස්) හෝ ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි වී සිටීම අනිවාර්ය වේ.

03. ශ්‍රී ලංකා රුපියල් මගින් පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, ගෙවීම් කටයුතු රණවිරු ඇපරල් ආයතනය වෙතින් සිදු කරනු ඇත.

04. ලියාපදිංචියෙන් පසු රු. 2,000,000.00 ට වැඩි මිලදී ගැනීම් වෙනුවෙන් 2024 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි (භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා) දක්වා ඇති පරිදි ලංසු ඇපකර හා ලංසු සුරක්ෂණ ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, දේශීය නිෂ්පාදනකවරුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

05. වැට් බද්ද (VAT) සඳහා ලියාපදිංචි වී ඇත්නම් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තු කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් එම සහතිකය සමග වැට් සක්‍රිය ලිපියේ පිටපතක් (VAT Active Letter) සහ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

06. තෝරා ගනු ලබන සැපයුම්කරුවන් 2026.06.01 දින සිට 2027.05.31 දින දක්වා කාලය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් යටතේ භාණ්ඩ ලබාදීම සඳහා කටයුතු කළයුතු අතර, යුද්ධ හමුදාව වෙතින් ලබා දෙනු ලබන පිරිවිතරයන්ට අනුව නියදියන් ලබාදීම අනිවාර්යය වේ.

07. අදාළ අයදුම්පත හා ලියකියවිලි එක් එක් කාණ්ඩයන් සඳහා රු. 1,500/- ක මුදලක් ගෙවා **ගණකාධිකාරී, රණවිරු ඇපරල්, ඩේවිඩ් මෙරික් පීරිස් මාවත, කිරිදිවැල පාර, යක්කල** වෙතින් සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 04.30 දක්වා 2026 මාර්තු මස 03 දින දක්වා ලබාගත හැකිය.

08. තැපැලෙන් අයදුම්පත් ලබාගැනීම රණවිරු ඇපරල් නමින් ලියන ලද **"ආදායකයාගේ ගිණුමට පමණයි"** ප්‍රේෂණපතක් ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැක.

09. සියලුම අයදුම්පත්‍ර ලියාපදිංචි තැපැලෙන් හෝ රණවිරු ඇපරල් යක්කල කර්මාන්තශාලා පරිශ්‍රයෙහි ඇති සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් පෙට්ටිය වෙත බහාලිය යුතු අතර, අයදුම්පත් විවෘත කිරීම 2026.03.04 දින ප.ව. 0200 පැයට සිදු කරන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

10. අයදුම්පත් එහි සඳහන් කරුණු මත ඇගයීමකට ලක්කරනු ලැබේ.

11. වැඩි විස්තර සඳහා රණවිරු ඇපරල් ප්‍රසම්පාදන කමිටු ලේකම් අමතන්න. (දුරකථන ඇමතුම් 033-2234430, 033-2224031 ඊමේල් rvapl.purchasing@gmail.com / rvapltender@gmail.com, වෙබ් www.army.lk/ranaviruapparel)

**සේනාවිධායක**
**රණවිරු ඇපරල්,**
**ඩේවිඩ් මෙරික් පීරිස් මාවත,**
**කිරිදිවැල පාර, යක්කල.**